# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ පැවරුම් නිබන්ධන ලබා දීමේ ඵලදායීතාව.

**යූ. කේ. ඩී. ශාන්ති**[1]

**සංක්ෂේපය**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අධ්‍යාපන රටාවේ ප්‍රධාන තීරකය වශයෙන් ගැනෙන්නේ වර්ෂ අවසාන හෝ අර්ධ වර්ෂ අවසාන විභාගයයි. එසේම ඇතැම් විශ්වවිද්‍යාලවල මෙම පරීක්ෂණයට සමගාමීව ශිෂ්‍යයින්ට පැවරුම් නිබන්ධන ලබා දිම සිදු වේ. එහෙත් මෙම පැවරුම් නිබන්ධන ලබාදීම ප්‍රයෝගික වශයෙන් ඵලදායී වන්නේද යන්න පරීක්ෂා කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ 4 නියෝජනය වන පරිදි ස්ථරායන නියැදීමෙන් අහඹු ලෙස සිසුන් 200 ලබා දෙන ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් දත්ත රැස්කර ගන්නා ලදී. එහිදී අනාවරනය වූ කරුණුවලට අනුව, සමාජීය විද්‍යා පීඨයේ, මානව ශාස්ත්‍ර පීඨය හා විද්‍යා පීඨය යන පීඨයන්වල ශිෂයන්ට වැඩි වශයෙන් ලිඛිත පැවරුම් නිබන්ධන ලබා දෙන බවත් කළමනාකරණ පීඨයේ වාචික නිබන්ධන බහුතරයක් ලබාදෙන බව තහවුරු විය. එසේම එහි ඵලදායිත්වය විමසීම අරමුණු කරගෙන සිදු කරන ලද මෙම පර්යේෂණයේදි න්‍යායාත්මක වශයෙන් විද්‍යාර්ථියාගේ ගවේෂණ හැකියාව වැඩි දියුණු කිරිමේ අරමුණින් මෙම පැවරුම් නිබන්ධන ලබා දුන්නද, ප්‍රායෝගික වශයෙන් එහි දී සිදු වන්නේ ශිෂ්‍ය කණ්ඩායම් වශයෙන් නිබන්ධන සිදු කිරීම හා බහුල වශයෙන් අන්තර්ජාලය හරහා ලබාගන්නා තොරතුරු නිසි අධ්‍යනයකින් තොරව නිබන්ධනයට යොදා ගැනීමයි. එමගින් විද්‍යාර්ථියා අමතර දැනුමක් ලබා ගැනීමේ සම්භාවිතාව බොහෝ අඩු මට්ටමක පවතින බව තහවුරු විය. එසේම විද්‍යාර්ථියාගේ ආකල්ප අනුව පැවරුම් නිබන්ධන හුදෙක් ඔවුන්ට අවසාන විභාගය සඳහා ලකුණක් ලබාගැනීම සඳහා පමණක් වූ අතර අමතර දැනුම ගවේෂණය හෝ එය මතකයේ තබා ගැනිම ඔවුන් නොසලකා හරින බව පැහැදිලි විය. එසේම නියැදියෙන් 40% පිරිසක් පැවරුම් නිබන්ධනයේදි ආවරණය වන විෂය පථය අවසාන විභාගයේදී අදාළ නොවේය යන පදනම මත අධ්‍යයනයෙන් බැහැර කරයි. එය ඉතා අහිතකර තත්ත්වයක් බව පර්යේෂණය අවසානයේ දී පැහැදිලි විය. මේ අනුව බලන කල විශ්වවිද්‍යාල තුළ මෙම පැවරුම් නිබන්ධන ලබාදීම පවතින තත්ත්වයට වඩා විධිමත් වුවහොත් ඉන් උපරිම ඵලදායීතාවයක් ලැබිය හැකි බව පර්යේෂණය අවසානයේ දී තහවුරු විය.

**මුඛ්‍ය පද :** නිබන්ධන, විද්‍යාර්ථයා, පැවරුම්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, divangika214@gmail.com